**ශ්‍රී ලංකා රේගුවේ රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල - 2024**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා රේගුවේ රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා අරමුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කල යුතු වුවද 2024 දෙසැම්බර් 31 දිනට රේගුව විසින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු එකතු වටිනාකම රු.4,800,470,461 ක හිඟ දණ්ඩන හා අභිමිකිරීම් මුදලින් මෙම අරමුදලට අදාල සියයට 20 ක වටිනාකම වූ රු. 960,094,092 ක වටිනාකම සහ දණ්ඩන හා අභිමිකිරීම් ලෙස මේ වන විටත් ලැබී ඇති නමුත් ත්‍යාග ගොනු සකස්කර නොමැති වටිනාකමින් අරමුදලට අදාල ප්‍රමාණයද අරමුදලේ ලැබිය යුතු ආදායමක් ලෙස දක්වා නොතිබුණි. ඒ අනුව වර්ෂ අවසාන දිනට තැන්පතු මගින් ලැබිය යුතු අරමුදල (දණ්ඩන හා අභිමි කිරීම්) ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වූ වටිනාකම නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. | සියලු දඩ හා රාජසන්තක ද්‍රව්‍ය විකුණුම් ආදායම් ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා වූ තාවකාලික රඳවා ගැනීමේ තැන්පතු ගිණුමට (18/128) බැර කරනු ලබයි. ඇතැම් විමර්ශන අවසන් වූ පසු විමර්ශනයට අදාල දඩ මුදල්, අදාල පුද්ගලයන් වෙත ආපසු ගෙවීමට සිදුවන අවස්ථා ඇත. තවද, මෙසේ තැන්පත් කරනු ලබන මුදල් වලින් විමර්ශන වලට අදාල වියදම් දැරීමට ද සිදු වේ. එබැවින් එම වියදම් අඩුකර ඉතිරි මුදල් රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට (50%), කළමනාකරණ වන්දි අරමුදලට (20%) සහ රාජ්‍ය ආදායමට (30%) වශයෙන් බැර කරනු ලබන්නේ විමර්ශන ගොනුව අවසන්ව ත්‍යාග ගොනු ගෙවීම සිදු කරන අවස්ථාවේදී ය. එබැවින් ලැබිය යුතු දණ්ඩන ආදායම් ගිණුම්ගත කිරීම සඳහා නිශ්චිත මුදලක් හඳුනා ගැනීම, අදාල විමර්ශනය අවසන් වනතෙක් සිදු කළ නොහැකි බැවින්, ඉහත විස්තර කළ පදනමින් ගිණුම් පවත්වා ගෙන යනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කළ යුතු වුවද, සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය වූ රු.151,821,560ක් වූ ආයුධ, පුස්තකාල පොත්, පරිගණක, පරිගණක උපාංග, රූපවාහිනි යන්ත්‍ර සහ විද්‍යාගාර උපකරණ සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.. | නිවැරදි කර ගැනීමට සටහන් කර ගතිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

1.5.2 **නොසැසඳුනු ගිණුම්**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1869 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 වගන්තිය ප්‍රකාරව රාජසන්තක සහ දණ්ඩන මුදල් හා රාජසන්තක ද්‍රවය විකුණුම් ආදායමෙන් රේගු ත්‍යාග අරමුදල සඳහා සියයට 50 ක් ද කළමනාකරණ හා වන්දි අරමුදල සඳහා සියයට 20 ක් ද වශයෙන් දායක විය යුතු විය. ඒ අනුව ත්‍යාග අරමුදලේ සමාලෝචිත වර්ෂය සඳහා ආදායම ලෙස හඳුනාගත් සියයට 50 ක දායකය වූ රු.8,975,906,478 ට සමානුපාතිකව කළමනාකරණ හා වන්දි අරමුදලේ සියයට 20 ක දායකය රු.3,590,362,591ක් විය යුතු වුවද කළමනාකරණ හා වන්දි අරමුදලේ ආදායම ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණේ රු.3,413,660,135 ක් වීම නිසා ආදායමේ රු.176,702,456 ක නොසැසඳීමක් විය. | විගණන නිරීක්ෂණය හා එකඟවිය නොහැකිය. වර්ෂයේ දණ්ඩන හා රාජසන්තක ද්‍රව්‍ය විකුණුම් ආදායමෙන් රේගු ත්‍යාග අරමුදල සඳහා 50% ක් වූ ආදායමට, 2024 වර්ෂයේ මුළු ගොනු සඳහා ගෙවීම් කළද, කොටස් ගෙවීමක් ඊට පෙර වර්ෂයේදී සිදු කර ඇත්නම් එම මුදල එකතු කර, 2024 වර්ෂයේ කොටස් ගෙවීම් කළ මුදල හා වෙනත් ලැබීම් අඩු කර ලැබෙන ආදායමෙන් 20% ක් කළමනාකරණ හා වන්දි අරමුදල සඳහා ආදායම ලෙස ගණනය කර ඇති අතර, එසේ ගණනය කළ මුදලට රේගු කළමනාකරණ හා වන්දි අරමුදලට වෙනත් ලැබීම් ලෙස ලැබී ඇති රු.455,841.32 ක මුදල ආදායමට එකතු කිරීමෙන් පසු, රු.3,413,660,134.59 ක මුදල ලැබී ඇත. | දණ්ඩන හා රාජසන්තක ද්‍රව්‍ය විකුණුම් ආදායමෙන් රේගු ත්‍යාග අරමුදල සඳහා 50% ක් බැර වන විට ඊට සමානුපාතිකව සියයට 20ක් මෙම අරමුදලට බැර විය යුතුය. |

1.5.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වත්කම් කාණ්ඩ 02ක් යටතේ පිරිවැය රු.123,465,298 ක් සහ සමුච්චිත ක්ෂය 117,667,414 ක් වූ දේපල පිරියත හා උපකරණ ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණ ද, පුස්තකාල පොත් සහ විද්‍යාගාර උපකරණ හැර අනෙකුත් වත්කම් සත්‍යාපනය කිරීමට අවශ්‍ය ස්ථාවර වත්කම් ලේඛණ , භාණ්ඩ සමීක්ෂණ වාර්තා, රඳවා ඇති ස්ථාන ආදි තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොවුණි. | ඔබගේ අංක PUR/B/CUS/INFO/2025/38 හා 2025.04.02 දිනැති ලිපියට පිළිතුරු ලෙස මාගේ අංක.CUS/FMU/DL/DDC/01/13 හා 2025.04.12 දිනැති ලිපිය මඟින් දන්වා ඇති පරිදි පුස්තකාලයට හා රසායනාගාරයට අදාල ස්ථාවර වත්කම් ලේඛන ඔබ වෙත එවා ඇත. | වත්කම් ආරක්ෂා කර ගැනීම හා වත්කම් සම්බන්ධ ගණන්දීමේ වගකීම තහවුරු කරගැනීම සඳහා අදාල ලිපි ලේඛනයන් පවත්වා ගත යුතුය. |

1.6 **නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (අ) | මු.රෙ.371 සහ 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 | තත්කාර්ය අතුරු අග්‍රිමය අදාල විශේෂිත කාර්යයට ආසන්නතම දිනයකදී නිලධාරියා වෙත ලබාදිය යුතු අතර, නිලධාරියා විසින් එම කාර්යය අවසන් කර දින 10 ක් තුල එම අග්‍රිමය පියවිය යුතුය. එහෙත් රේගු නිලධාරීන්ගේ කළමනාකරණ වන්දි අරමුදලින් අවස්ථා 12 කදී ලබාදී තිබූ රු.5,000 සිට රු. 700,000 දක්වා පරාසයක වූ අත්තිකාරම් මුදල් පියවීම සඳහා දින 12 සිට 53 ක කාලයක් ගතවී තිබුණි. | මානව සම්පත් සංවර්ධන අංශය විසින් ලබා ගන්නා පුහුණු වැඩමුළු සඳහා අත්තිකාරම් මුදල් පුහුණු වැඩසටහන ආරම්භක දිනයේදී ලබාගනු ලැබුවද එම වැඩසටහන් ඇතැම්විට මාසයක් වැනි කාලයක් පුරා පවත්වනු ලබන අතර වැඩසටහන්වල අවසන් දිනයේ සිට නොපමාව අත්තිකාරම් පියවීමට ක්‍රියාකර ඇත. කෙසේවුවද, ලබා ගන්නා අත්තිකාරම් මුදල් අදාල වැඩසටහන අවසන් වූ වහාම පියවීමට සටහන් කර ගතිමි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානයන්ට අනුකූලව විය යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 371(2) | කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්වයේ නිලධාරීන්ට පමණක් රු.100,000 ක උපරිමයට යටත්ව තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දීමට හැකි අතර එම උපරිම සීමාව ඉක්මවා යන්නේනම් ප්‍රසම්පාදන ක්‍රියාවලියකට යොමුවිය යුතුය. එහෙත් එකී සිමාවන් ඉක්මවා තිබූ අවස්ථා දෙකකදී සීමාවන්ගෙන් බැහැරව කටයුතු කිරීම සඳහා අතුරු අග්‍රිම ලබාගත් කාර්යය කොටස් දෙකකට වෙන්කර නිලධාරීන් දෙදෙනෙකු වෙත අවස්ථාවන් දෙකක් ලෙස එකතුව රු.124,000ක හා රු.190,000ක අතුරු අග්‍රිම ලබාදී තිබුණි. | ඉදිරි අවස්ථාවලදී නිවැරදි කර ගැනීමට සටහන් කර ගතිමි. | මුදල් රෙගුලාසි විධිවිධානයන්ට අනුකූල විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,346,928,257 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,400,069,243ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.946,859,014 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට දණ්ඩන මුදල් ආදායම රු. 863,146,555 ක් ඉහල යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරූ රේගු නිලධාරීන් 49 දෙනෙකු සඳහා රු. 19,350,000ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි. එම ප්‍රතිපූර්ණයන්ට අදාලව නිලධාරීන් 48 දෙනෙකු සමඟ ඇතිකරගත් ගිවිසුම්වල මුල්පිටපත් හා නිලධාරීන් 27 දෙනෙකුට අදාල පාඨමාලා සහතිකපත්වල පිටපත් පෞද්ගලික ලිපිගොනු වෙත යොමු කිරීමට කටයුතු කර නොතිබුණි. | පශ්චාත් උපාධි හැදෑරූ නිලධාරීන් සමඟ ඇති කර ගත් ගිවිසුම් මානව සම්පත් සංවර්ධන අංශයේ අදාල නිලධාරියා වෙනුවෙන් විවෘත කරනු ලබන ලිපිගොනුවේ ඇතුළත් කරනු ලබයි. ඉදිරියේදී, එම ගිවිසුමේ මුල් පිටපතම අදාල නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවලට ඇතුළත් කිරීම සඳහා මානව සම්පත් කළමනාකරණ අංශය වෙත ලබා දීමට සටහන් කර ගතිමි. පශ්චාත් උපාධි හදාරන නිලධාරීන් විසින් පාඨමාලා ගාස්තු ප්‍රතිපූරණයේදී ලබා දෙන උපාධි සහතිකවල පිටපතක් ද අදාල විශ්ව විද්‍යාල වෙතින් ලබා දෙන තහවුරු කිරීමේ ලිපියේ පිටපතක් ද සමඟ එම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ලබා දීමට සටහන් කරගන්නා බව ද වැඩිදුරටත් කාරුණිකව දන්වමි. | ගිවිසුම්වල මුල් පිටපත් හා පශ්චාත් උපාධි පාඨමාලා සහතිකවල පිටපත් අදාල නිලධාරීන්ගේ පෞද්ගලික ගොනුවලට ඇතුලත් කල යුතුය. |
| (ආ) | රේගු බදු වංචාවන් පාලනය කිරීම සඳහා කෘතීම බුද්ධිය සම්බන්ධ කරන ලද දියුණු ක්‍රමවේද හඳුන්වා දීමට ප්‍රමාණවත් පියවර නොගැනීම සහ නිලධාරින්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතු තුළදී හඳුනා ගන්නා විවිධ රේගු වැරදි සඳහාම බහුල වශයෙන් ත්‍යාග ගෙවීමට කටයුතු කිරීම මෙන්ම හඳුනාගන්නා සියළුම රේගු වැරදි සඳහා සියයට 20 ක ප්‍රතිශතයක් අරමුදලට බැර වීමත් හේතුවෙන් අරමුදල අඛණ්ඩව වර්ධනය වී තිබුණි. | රේගු බදු වංචා පාලනය කිරීම සඳහා කෘත්‍රිම බුද්ධිය උපයෝගී කර ගැනීම සාධනීය පියවරකි. කෙසේ වෙතත්, රේගු නිලධාරීන්ගේ සුවිශේෂී හැකියාව, දැනුම හා අත්දැකීම් රේගු බදු වැරදි, වංචා හඳුනා ගැනීමේදී උපයෝගී කර ගැනේ. තවද, රේගු ආඥා පනතේ විධිවිධාන හා දෙපාර්තමේන්තු නියෝගයන් ප්‍රකාරව අදාළ මුදල් මෙම අරමුදලට බැර කෙරෙනු ඇත. රේගු බදු වංචා හෝ තහනම් කරන ලද හා සීමා කරන ලද භාණ්ඩ රට තුළට ගෙන ඒම වැළැක්වීමේ අන්තර්ජාතිකව පිළිගත් සාධනීය ක්‍රමවේදය වන්නේ නිලධාරීන්ට හෝ ඔත්තුකරුවන්ට ත්‍යාග මුදල් ලබා දීම | රේගු බදු වංචාවන් පාලනය කිරීමට නවීන තාක්ෂණික ක්‍රම හඳුන්වාදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වන අතර එහිදී ඊට අදාළ තැගි මුදල් ලබා දීමේදී රාජකාරී ස්වභාවය නොසළකා හැරේ. | |
| (ඇ) | සමහර අවස්ථාවල දී වංචා කිරීමට උත්සාහ කළ භාණ්ඩ සහ බදු වටිනාකමට සාපේක්ෂව තෙගුණයක වටිනාකමක් දක්වා දණ්ඩන පැනවීම, රේගු වැරදිවල කැපී පෙනෙන අඩුවීමක් සිදු වී නොතිබීම, වර්තමානයේ පවත්නා නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් ආනයන හා අපනයනවල ඇති වී ඇති සංකීර්ණතාවයට ගැලපෙන අයුරින් රේගු ආඥා පනත හා අදාල අරමුදල්වල නෛතික විධිවිධාන විධිමත්ව හා කාලීනව සංශෝධනය වී නොතිබීම හේතුවෙන් දණ්ඩන හා අභිමි කිරීම් මඟින් රේගු වැරදි පාලනය කිරිමට නොහැකි වී තිබුණි. | වර්තමානයේ පවත්නා නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් ආනයන හා අපනයනවල සංකීර්ණත්වයක් ඇති වී ඇත. එම සංකීර්ණත්වය හේතුවෙන් ආනයන භාණ්ඩ නිෂ්කාශන ක්‍රියාවලිය සිදුවන අවස්ථාවේදීම රේගු වැරදි හඳුනා ගැනීමට ඇති ඉඩකඩ අවම වන අතර මේ වන විට ලොව පිළිගත් ක්‍රමවේදය වන්නේ පසු නිෂ්කාශන විගණනය වේ(Post audit) ඒ සඳහා වන ප්‍රතිපාදන රේගු ආඥා පනතේ පවතී.<br>රේගු වංචා සම්බන්ධ වරදට භාණ්ඩවල වටිනාකම මෙන් තෙගුණයක් දක්වා දණ්ඩන පැනවීම හා වැඩි වංචා ප්‍රමාණයක් හෙළිදරව් කර ඒ සඳහා දණ්ඩන/ අභිමි කිරීම් පැනවීම, දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන සම්බන්ධව සහ ආදායම් ඉලක්ක සපුරා ගැනීමට විශාල වශයෙන් දායක වී ඇත.<br>දණ්ඩන වටිනාකමින් ප්‍රතිශතයක් මෙම අරමුදලට මුදල් බැර වන තත්ත්වයක් තුළ දණ්ඩන ආදායම ඉහල යාමට සමානුපාතිකව අරමුදලට බැර වන මුදල් ප්‍රමාණයද, ඒ සමඟම රජයේ අදායමද ඉහළ යාම යහපත් තත්ත්වයකි. | දණ්ඩන හා අභිමි කිරිම්වලට අතිරේකව රේගු වැරදි පාලනය කිරීම සඳහා සුදුසු නව තාක්ෂණික ක්‍රමවේද ස්ථාපිත කළ යුතුය. |
| (ඇ) | රේගු නිලධාරීන් සිය රාජකාරීවල නිරතවීමේදී වන ආපදාවන්ට වන්දි ගෙවීම සඳහා අරමුදල් සපයා ගැනිම අරමුදලේ මූලික අරමුණක් ලෙස හඳුනාගෙන ඇතත් ඉකුත් වර්ෂ 12 ක කාල පරිච්ඡේදය තුළ එවැනි කිසිදු වන්දි ගෙවීමක් සිදු වී නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. | අරමුදලට වෙන්කර ඇති ප්‍රතිශතය නැවත සමාලෝචනය කර සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂ 05 ක එකතු ආදායම රු. 8,823,186,266 ක් වූ අතර එම කාලපරිච්ඡේදය තුල අරමුදලින් වැය කර තිබූ මුදල (ක්ෂයවීම් හැර) රු. 240,493,766 ක් විය. ඒ අනුව මුළු ආදායමෙන් සියයට 3 ක් පමණ වැය කර සියයට 97 කින් අරමුදල සමුච්චනය කර තිබුණි. මේ | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. | අරමුදලට වෙන්කර ඇති ප්‍රතිශතය නැවත සමාලෝචනය කර සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හේතුවෙන් අරමුදලට වාර්ෂිකව වෙන් කරන මුදල් ප්‍රමාණය පිළිබඳ නැවත සමාලෝචනයක් සිදුකල යුතුව ඇත. | | |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ වියදම් පිළිබඳව තථ්‍ය හා අයවැයගත දත්ත සැලකිල්ලට ගත්කල වියදම් අයිතම තුනක ඇස්තමේන්තු ගත අගයන් තත්‍ය අගයන්ට වඩා සියයට 64 සිට සියයට 72 දක්වා වැඩියෙන් හා ආදායම් අයිතමයන් සියයට 54 ක් වැඩියෙන් ඇස්තමේන්තුගත කර තිබීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන මෙවලමක් ලෙස යොදාගෙන නොතිබුණි. | <u>දේශීය පුහුණු වියදම්</u><br>දේශීය පුහුණු වියදම් ඇස්තමේන්තුගත වියදමට වඩා අඩුවීම කෙරෙහි සැලසුම් කරනු ලබන ඇතැම් දේශීය පාඨමාලා අපේක්ෂිත ලෙස පැවැත්වීමට නොහැකි වීම හේතු වී ඇත. එසේ වීමට පුහුණු අවශ්‍යතා සමීක්ෂණයේදී මෙම පාඨමාලා හඳුනාගනු ලැබුව ද ඇතැම් විට පුහුණුව සඳහා නිලධාරීන් ඉල්ලුම් නොකිරීම සහ අපේක්ෂිත ප්‍රමාණයට වඩා අවම නිලධාරි පිරිසක් සහභාගී වීම බලපා ඇත.<br><br><u>විදේශීය පුහුණු වියදම්</u><br>එසේම, විදේශීය පුහුණු වියදම් ඇස්තමේන්තුගත වියදමට වඩා අඩුවීම කෙරෙහි පෙර වසරට සාපේක්ෂව ලැබී ඇති විදේශ පුහුණු අවස්ථා අඩු වීම, රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලෙන් වියදම් දැරීමට අවශ්‍ය වන ඇතැම් විදේශීය පුහුණු පාඨමාලා සඳහා අනුමැතිය රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් මුදල් අමාත්‍යාංශය වෙතින් ඉල්ලුම් කළ ද, එම අනුමැතිය නොලැබීම ද හේතු වී ඇත.<br>විගණනය විසින් පෙන්වා දී ඇති අයවැය ලේඛනමය පාලනය සම්බන්ධයෙන් වූ අනෙකුත් නිරීක්ෂණ අනුව ඉදිරියේදී අඩුපාඩු නිවැරදි කිරීමට සටහන් කර ගනිමි.<br><u>රාජසන්තක භාණ්ඩ අලෙවි කිරීමෙන් ලද ආදායම</u><br>විවිධ අංශ මගින් විකිණීම සඳහා මධ්‍යම අපහරණ අංශයට යොමු කරනු ලබන භාණ්ඩ නොපමාව ටෙන්ඩර මගින් විකිණීමට ඉදිරිපත් කිරීම සිදු කරන අතර මධ්‍යම තක්සේරු අංශයෙන් ලබා දෙනු ලබන තක්සේරුව අභිබවා යන ඉහලම ලංසුව ඉදිරිපත් කරනු ලබන ලංසුකරු වෙත විකිණීම සිදු කරනු ලබයි.<br>වසරකදී අනෙකුත් අංශ මගින් වැඩි භාණ්ඩ ප්‍රමාණයක් විකිණීම සඳහා | හැකිතාක් දුරට තත්‍ය අගයන්ට සමීප වන සේ ඇස්තමේන්තු සකස් කිරීම මගින් අයවැය ලේඛනය ඵලදායී කලමණාකරන පාලන මෙවලමක් ලෙස භාවිතා කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මධ්‍යම අපහරණ අංශයට යොමුවීම සිදු වුවහොත් වැඩි ආදායමක් උපයා ගැනීමට හැකියාව ලැබේ. | |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී ක්‍රීඩා හා ශාරීරික යෝග්‍යතා සඳහා වාර්ෂික අයවැය තුල රු.4,000,000ක ප්‍රතිපාදන වෙන් කර ඇතත් වර්ෂය තුළදී ඉන් කිසිදු මුදලක් වැයකර නොතිබුණි. | මේ පිළිබඳව සොයා බලා අවශ්‍ය පියවර ගැනීමට සටහන් කර ගතිමි. | අරමුදලෙහි අපේක්ෂිත අරමුණු නැවත සමාලෝචනය කර අයවැය ඇස්තමේන්තු සකස් කල යුතුය. |